උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 3

"අපේ අප්පච්චි දුර දිග ගිය සම්බන්ධකං කීපයක්ම ඊට පස්සෙ ඇතිකරගෙන තියෙනවා. අස්ගිරිය පැත්තෙ ගෑණු කෙනෙකුට දුවක් ඉන්නවලු අප්පච්චිගෙන්. වැඩිපුර ඉඩං ලියලා තියෙන්නෙ ඒ කෙල්ලටලු "

ඔහු ඒ ප්‍රශ්නය නැගුවේ මෝඩයකු ගේ විලාශයෙනි. ඔහුගේ පැනයට සිනාසෙනු මිස මට දිය හැකි පිළිතුරක් නොවීය. ඔහුගේ ව්‍යාජ රංගනය ම විසින් මුළුමනින්ම අවබෝධ කරගත්තාය යන හැඟීම සසංක විලියෙන් මුසපත් කළා විය යුතුය. අප වලව්වට ලඟා වූයේ

කථා කිරීමේ අවස්ථාව අවාසනාවන්ත ලෙස මට මගහැරී ගියේය. ජීවිතයේ අප මුහුණ දෙන සියලු වාතාවරණයන් කල් ඇතුව සකස් වූ සැලසුමකට අනුව සිදුවන්නක් බව ඔබට පසක් කරගැනීමට මගේ කථාව කදිම නිදසුනකැයි මම විශ්වාස කරමි.

000000000000000

අපේ විවාහයෙන් සිව් මසක් පමණ ඉක්ම ගිය පසු එක්තරා දෛවෝපගත දිනයක මම නුවර සිට කොළඹ බලා රිය ධාවනය කරමින් සිටියෙමි. අත්තනගල්ල නගරයට ආසන්න වන විට උදෑසන සිට වරින්වර මතුවෙමින් ආ හිස කරකැවිල්ල මා වඩාත් අපහසුතාවට පත් කරමින් ප්‍රහලව නැගී සිටින්නට වූයෙන් මම කුඩා ආපනශාලාවක් ආසන්නයෙන් රිය නවතා තාත්තාට ඇමතුමක් ලබා ගත්තෙමි. අම්මා සහ තාත්තා සමඟ අපේ පවුලේ වෛද්‍යවරයා හමුවන්නට යන අතරවා-රයේ මම සසංක අමතා කෙටියෙන් මගේ අසනීප තත්ත්වය කියා සිටියෙමි.

පවුලේ අයකු බවට නිරායාසයෙන්ම පත්වෙමිනි. අම්මාත් තාත්තාත් සසංක ව දයාවෙන් පිළිගත්තේ තම දරුවකු තරමට විශ්වාස කරමිනි.

සසංක මා වෙත සමීප වීම පිටුපස ඇති සැබෑ අරමුණු මොනවාදැයි සොයා සිත වෙහෙසවීමට අවශ්‍ය මානසික ඒකාග්‍රතාවක් ඒ වන විට මා තුල නොවූයේ මන්දැයි මම දැන් උදක්ම කල්පනා කරමි. සසංක කෙරෙන් ලද අවධානය හා ආදරය යැයි මා සිතූ හැඟීම අනල්පව විඳ දරා ගත්තා විනා ඔහුගේ මා හොඳින් දන්නා නුදුරු අතීතය පිළිබඳ සිහිකර මගේ හදවත ප්‍රශ්න කිරීමට මට උවමනා නොවීය. සහජයෙන්ම මා තුළ පිහිටියා වූ අනෙකා නොරිදවීමේ ගුණාංගය පරයා නැගී සිටියේ එකල මා පෙළෙමින් සිටි ශාරීරික අපහසුතා නොවේ දැයි මට දැන් සිතේ. ඇතැම් විට මගේ මානසික සංකූලතා දරුවා කෙරෙහි යම් බලපෑමක් ඇති කරාවිද්දෝයි හටගත් සාධාරණ බියද සසංක කෙරෙහි විශ්වාසයෙන් ජීවත්වන්නට මට හේතුකාරණා සපයන්නට ඇත. එනයින් බැලූ කල ගැහැණියක් ලෙස එකල මා ගතකොට ඇත්තේ කෙතරම් දුක්බර ජීවිතයක් දැයි මට දැන් සිතේ.

කොළඹින් බැහැර නගරවල වසර කීපයක් තිස්සේ මා පවත්වා ගෙන ආ ප්‍රංශ භාෂාව පිළිබඳ පෞද්ගලික

## "ඔය ඔක්කොම ණය ටික පියවගන්න හිතාගෙනද ඔයා මාව බැන්දෙ?"

"එතකොට ඔයාට ඉගැන්නුවෙ කවුද?"

"අම්මා තමා දුක්විඳලා මට ඉගැන්නුවෙ.වත්තෙ කෙසෙල්කැන් ටික තැඹිලි ටික පවා විකුණලා අමාරුවෙන් ඉතුරු කරලා මට ඉගැන්නුවෙ.සමහරදාට නිවාඩුව ඉවරවෙලා බෝඩිමට යද්දි මට බස් එකට සල්ලිවත් දීගන්න බැරි තරමට අමාරු දවස් තිබුණා අපෙ අම්මට."

"ඇයි අප්පච්චි ඕගොල්ලො ගැන බැලුවෙ නැද්ද?"
"අප්පච්චි මට ආදරෙයි. ඒත් එයාට අම්මව පෙන්නන්න බැරුව තිබුණෙ. ආර්තී අක්ක ගැන එයාගෙ නෑදැයො බැලුවට මට කවුරුවත් හිටියෙ නැහැ. ඒ වෙනකොට මගේ සීයත් මැරිලා නිසා අම්මට කාත් කවුරුවත් හිටියෙ නැහැ.අප්පච්චි මැරුණට පස්සෙ වතුපිටි වල ආදායම අම්මගෙ අතට ලැබුණා. ඒත් අප්පච්චි මැරෙනකොට සෑහෙන ණය කන්දරාවක් ඉතුරු කරලා මැරුණෙ. ඒ ණය බේරන්න ඉතුරු වෙලා තිබ්බ ඉඩකඩං ටිකත් විකුණන්න වුණා. අන්තිමටයි දන්නෙ වලව්ව උකස් කරලා තියෙන බව. ඒ බව මුලින් දැනගත්තනං අපි ඔක්කොටම කලින් වලව්වෙ උකස බේරගන්නවා."

වැව රවුමේ ඇවිදින යොවුන් පෙම් යුවළක් එකිනෙකාගේ දෑත් පටලාගෙන සිනාසලමින් ප්‍රීති වූහ. මම දිය කඳට ඔබ්බෙන් පෙනෙන මාලිගාව දෙස අරමුණකින් තොරව බලා සිටියෙමි. යළිත් සසංකගේ මුහුණ දෙස බැලූ මම සිත තුළ තෙරපෙන පැනය වචන වලට පෙරලා ඔහු ට දමා ගැසුවෙමි.

"ඔය ඔක්කොම ණය ටික පියවගන්න හිතාගෙනද ඔයා මාව බැන්දෙ?"
මගේ තියුණු පැනයෙන් ඔහු දුර්මුඛව මො-හොතක් බලා සිටියේය.

"අඩුම තරමේ ඉන්න ගෙයි උකසවත් බේරගන්න ඕනෙ දුලිනි" සසංක කථා කලේ සොරෙකුගේ විලාශයෙනි.

"ඕගොල්ලොන්ගෙ තාත්තා සල්ලාලකමේ යන්න වියදංකරපුවා පියවන්න ඕනෙ අපේ තාත්තා නම්බුකාර විදියට හම්බකරපු දේවල් වලින්ද? ඒක මොන තරං ලැජ්ජනැති කමක්ද? කොච්චර අසාධාරණද ? ඔයාගෙ අම්මා වගේ නූගත් ගෑණියෙක් එහෙම හිතුවට කමක් නෑ කියමුකො! ඒත් ඔයා ඇයි එහෙම පටු කල්පනාවකින් මාව බැන්දෙ?" මම හැකිතාක් කෝපය මැඩගෙන කථා කළෙමි. සසංක කරබාගෙන සිටියා විනා මා සමඟ තර්ක කළේ නැත.

" ඔයා හිතන්නෙ මං ඔයාට ආදරේ නැහැ කියලද ?"

ගොළුවන් ලෙසිනි.

සසංකගේ පාපොච්චාරණය ඔහුගේ මවගේ අනුදැනුම ඇතුව සිදුවූවක් බව මම අනුමාන කළෙමි. මේ මො-හොතේ මවිසින් කළයුත්තේ කුමක්දැයි තීරණය කළ නොහැකිව මම ගැඹුරට කල්පනා කළෙමි. සසංක විසින් සැහැසි ලෙස මා රවටා ඇති බව වැටහී ගියත් එය මා තුල කම්පනයක් ඇති නොකළේ මන්දැයි මට නොවැට-හේ. ඇතැම්විට බෝඩිංකරුවන් ලෙසින් ජීවත්වන අප

විවාහය පිළිබඳ තීරණාත්මක තීරණයක් ගත යුතුව සිටි අදියරකදී මා ගැබිණියක බව දැන ගැනීම මා තුල ඇති කළේ එක්තරා අසරණකමකි. ගැහැණියක වශයෙන් සිත පුරා සතුටුවිය යුතු මොහොතක අම්මා සහ තාත්තාගේ ආදරණීය මුහුණ වල තිබූ අපමණ සතුට බිඳ දැමිය නොහැකි පදනම මත මම ව්‍යාජ සතුටක් ආරෙ-ාපණය කරගතිමි. නමුත් මා කිසිසේත් බලාපො-රොත්තු නොවූ පරිද්දෙන් මේ යුගයේදී සසංක මා

දේශණ සියල්ල මගේ මිතුරියක වෙත තාවකාලිකව පවරා දී මගේ රජයේ රැකියාව පමණක් කරගෙන යාමට මේ වන විට මම තීරණය කර සිටියෙමි.මගේ සිඟිති ගර්භය කෙරෙහි බලපෑමක් වේ යැයි හටගත් අහේතුක බිය නිසා ඒ වන විට මම සම්පූර්ණයෙන්ම මෝටර් රථ ධාවනයෙන් වැලකී සිටියෙමි. දිනපතා මා කන්තෝරුවට ඇරලවූ තාත්තා නොවරදවා මා කැටුව යෑමට හැන්දෑවට පැමිණියේය. එහෙත් සෑම සිකුරාදාවකම මා රැගෙන යෑමට පැමිණියේ



අතර අල්ප වශයෙන්වත් ගොඩනැගුණු හෘදයාංගම මා-නසික බැඳීමක් නොතිබීම ඊට හේතුවන්නට ඇත.

අම්මා සමඟ හෝ අක්කා සමඟ මේ සියල්ල පවසා කිසියම් තීරණයක් ගැනීම මැනවැයි මට කල්පනා වූ වාර ගනණ අපමණය. නමුත් කිසියම් හෝ හේතුවක් කරණ කොටගෙන ගෙදර යාම වරින් වර පමා වූවා විනා සසංක හේතුවෙන් මා මුහුණ පා සිටින තත්ත්වය මගේ පවුලේ උදවිය සමඟ පැහැදිලිව දීර්ඝ වශයෙන්

කෙරෙහි වඩාත් බැඳෙන්නට වූයේය. නුවර සිට දිනපතා කොළඹ පැමිණීම මගේ උදෑසන අපහසුතා තත්ත්වයන් සමඟ අතිශය දුෂ්කර වූයෙන් සසංකගේත් මගේ මව්පියන්ගේත් පොදු තීරණයකට අනුව මම ගැබිණි සමයේ පළමු ත්‍රෛමාසිකය අපේ නිවසේ රැඳී සිටියෙමි.සෑම සති අන්තයකම නොවරදවාම මා බැලීමට ඔහු පිළියන්දල පිහිටි අපේ නිවසට පැමිණයේය. ඔහු මුළු සති අන්තයම මා සහ මගේ පවුලේ උදවිය සමඟ ඉතාම කුළුපග ලෙස ගෙවා දැමුවේ අපේ

සසංකය. සතිඅන්තය අපේ පවුලේ අය සමඟ ප්‍රීතියෙන් ගෙවා දමන ඔහු සඳුදා නැවතත් නුවර යන්නේ මා කන්තෝරුවට ඇරලවා ගෙනය. එක් දීර්ඝ සති අන්තයක සසංකට මා කැඳවා ගෙන යෑමට පැමිණිය නොහැකි වූයෙන් ඔහු පසුදා උදෑසන සිය මව සමඟ අපේ පිළියන්දල  නිවසට පැමිණියේය.

"දුලිනි දැන් ආපහු වලව්වට යන්න කාලෙ හරි,ආයෙම අට මාසෙන් තමුන්ගෙ අම්මා ලඟට එන්න